**කැගල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 15 - 2024**

**-----------------------------------------------------------------------**

**1. විගණන මතය**

**1.1** කැගල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 15 ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2** කැගල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 15 කට අදාළව නිකුත් කර තිබුණු විගණන වාර්තා 15 හි තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර ඇති අතර, තත්ත්වාගණනය කළ මතය සඳහා හේතු වී තිබුණු ප්‍රමාණාත්මක දෝෂ පහත දැක්වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම**

| | **විගණන නිරීක්ෂණ** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | කාරක සභා 13ක ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 21 ඡේදය ප්‍රකාරව ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබූ අතර ප්‍රමිත අංක 07 හි 25 ඡේදය ප්‍රකාරව වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව කටයුතු කරන බව හා පවරාගෙන නොමැති ඉඩම් පවරාගැනීමෙන් පසු වත්කම් තක්සේරු කර ගිණුම්ගත කරන බව . | ගිණුම් ප්‍රමිති ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුවීම. |
| (ආ) | කාරක සභා 06ක ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 40, 41, හා 42 ඡේද ප්‍රකාරව පිරිවැය ආකෘතිය හෝ ප්‍රත්‍යාගණන ආකෘතිය භාවිතයෙන් තොරව වාර්ෂික ශුද්ධ අගය මත ක්ෂය කරමින් ස්ථාවර වත්කම් ගිණුම් ගත කර තිබුණි. | දෙපාර්තමේන්තුවෙන් උපදෙස් විමසා ඒ අනුව කටයුතු කරන බව. | ගිණුම් ප්‍රමිති ප්‍රකාරව වත්කම් ගිණුම්ගත කල යුතුවීම. |
| (ඇ) | යටියන්තොට ගොවිජන සේවා කාරක සභාව විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 76 ඡේදය ප්‍රකාරව සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලබන බව ගිණුම්වල හෙළිදරව් කර තිබුණද, ධාරණ අගය පදනම් කරගෙන ක්ෂය ගණනය කර තිබුණි. | දෙපාර්තමේන්තුවෙන් උපදෙස් විමසා ඒ අනුව කටයුතු කරන බව . | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර ඇති ක්ෂය ප්‍රතිපත්තිය අනුව ක්ෂය කල යුතුවීම. |
| (ඈ) | කාරක සභා 14ක ගොවිජන බැංකුවට අදාළ සියළුම ගිණුම් ගොවිජන කාරක සභාවේ වාර්ෂික අවසන් ගිණුම්වලට ඇතුළත් කර | දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇති ආකෘතියට අනුව සකස් කල බව . | චක්‍රලේඛ ප්‍රකාරව ඒකාබද්ධ ගිණුම් ඉදිරිපත් කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | | |
| (ඉ) | කාරක සභා 4 කට අදාළ ගොවිජන බැංකු 4 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 21 ඡේදය ප්‍රකාරව ගොවි බැංකු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි. | කාරක සභා 04කට අදාළ ගොවිජන බැංකු 04ක් ඉදිරියේදී නිවැරදි කරන බව දන්වා ඇත. | ගිණුම් ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුවීම . |

## 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂයට අදාළ ආදායම රු.132,545 ක් වැඩියෙන්, රු.689,652 ක වැරදි ආදායම් බැර කිරීමෙන්, රු. 9,560 ක ගැණුම් අඩුවෙන් , රු.59,216 ක වියදම් අඩුවෙන් හා පෙර වර්ෂයට අදාළ රු.4000 ක ආදායම් ගිණුම්ගත කිරීම වැනි හේතු නිසා කාරක සභා 08ක අතිරික්තය එකතුව රු.894.973 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව . | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම් වර්ෂයට අදාළ ආදායම් හා වියදම් නිවැරදිව ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වර්ෂයට අදාළ රු.875,555 ක ආදායම අඩුවෙන්, රු. 37,500 ක ගැණුම් වැඩියෙන් , රු.125,082 ක වියදම් වැඩියෙන්, පෙර වර්ෂයට අදාළ රු.57,795 ක වියදම් හා රු.1,102,600ක ස්ථාවර වත්කම් මිලදී ගැනීම් වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම වැනි හේතු නිසා කාරක සභා 10ක අතිරික්තය එකතුව රු.2,198,532 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව . | - එම - |
| (ඇ) | කාරක සභා 09ක ලැබිය යුතු රු.239,493 ක ආදායම්, රු.26,556 ක බැංකු ගිණුම් ශේෂ හා ද්‍රව්‍ය ණය නිකුත් කිරීම වෙනුවෙන් ගොවි බැංකුවෙන් ලැබිය යුතු රු.1,108,981 ක් ගිණුම්ගත නොකිරීම හා රු. 395,058 ක ස්ථාවර තැන්පත්, රු. 23,650 ක තොග අඩුවෙන් ගිණුම්ගත කිරීම නිසා එකතුව රු.1,793,738 කින් ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව . | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | කාරක සභා 06ක රු.17,157,503 ක ස්ථාවර වත්කම් ගිණුම්ගත නොකිරීම නිසා ජංගම නොවන වත්කම් එම | නිවැරදි කිරීමට කටයුතු කරන බව . | වත්කම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු අතර, අදාළ ගැලපීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබූ අතර එම වටිනාකමට අදාළ ක්ෂය වියදමද අවගණනය වී තිබුණි. | | |
| (ඉ) | කාරක සභා 02 ක රු.2,832,402 ක ජංගම වගකීම් වැඩියෙන්, කාරක සභා 02 ක රු. 5,081 ක ජංගම වගකීම් අඩුවෙන් හා එක් කාරක සභාවක ජංගම නොවන වගකීම් රු. 600,000 ක් වැඩියෙන් ගිණුම්ගතකර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව . | වගකීම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ඊ) | ගොවිජන බැංකු 06ක රු.40,460,800 ක් වටිනා ජ'නල් සටහන් 346 ක් සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ජ'නල් සටහන් සඳහා අනුමැතිය ලබා ගත යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (උ) | ගොවිජන බැංකු 09ක වර්ෂය ආරම්භයේ රු.376,495,515ක් වූ වත්කම් රු.290,095,525ක් වූ බැරකම් හා රු.86,399,991ක් වූ ස්කන්ධ ගිණුම් ජ'නලයේ සටහන් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. . | ජ'නල් සටහන් මගින් ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | ගොවිජන බැංකු 05ක ශේෂ පිරික්සුමේ ඇති රු19,523,916 ක් වටිනා ගිණුම් 27ක් සඳහා පොදු ලෙජරයෙහි ගිණුම් පවත්වා නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ලෙජරයෙහි ගිණුම් පවත්වා ගෙන යාමට කටයුතු කළ යුතුය. |

**1.3.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 09 ක ගිණුම් විෂයයන් 21 ක මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම හා අනුරූපී වාර්තා අනුව එම ශේෂය අතර රු.1,477,970 ක වෙනසක් පැවැතිණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව . | අනුරූපී ලේඛන මූල්‍ය ප්‍රකාශන සමග සැසඳීම් සිදු කර අදාළ ගැලපීම් කළ යුතුය. |
| (ආ) | ගොවිජන බැංකු 08ක ගිණුම් 28 ක ලෙජරය සහ ශේෂ පිරික්සුම අතර රු.5,843,550 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කරන බව. | - එම - |

## 1.3.4 අධිකාරී බලය නොලත් ගණුදෙනු

| | අධිකාරී බලය නොලත් ගණුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 03ක වර්ෂය ආරම්භයේ රු.51,607,353 ක වත්කම්, රු.19,318,602 ක බැරකම් සහ රු.32,288,751 ක ස්කන්ධ ගිණුම් ලෙජරයට සටහන් කිරීම ජ'නල් සටහන් මඟින් කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව . | ජ'නල් සටහන් මඟින් ලෙජරයට සටහන් කළ යුතුවීම. |
| (ආ) | කාරක සභා 03ක වටිනාකම රු.739,524,607 ක් වූ ජ'ර්නල් සටහන් 42 ක් අනුමත කර නොතිබූ අතර ජ'නල් සටහන් යෙදීමකින් තොරව රු.141,951 ක් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව . | අනුමැතිය ලබාගෙන ජ'නල් සටහන් යෙදිම කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |

## 1.3.5 අවිනිශ්චිත ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 4කට අදාළ අවිනිශ්චිත ගිණුම්වල දීර්ඝ කාලයක සිට පැවත එන රු.212,892 ක හර ශේෂ හා රු. 12,948 ක බැර ශේෂ නිරවුල් කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව . | කඩිනම් වැඩපිළිවෙලක් යොදා අවිනිශ්චිත ගිණුම් ශේෂ නිරවුල් කිරීම කළ යුතුය. |

## 1.3.6 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 04ක රු.49,521,550 ක් වටිනා ගිණුම් විෂයන් 48 ක වත්කම් ලේඛන,ශේෂ සනාථ කිරීම් හා කාල විශ්ලේෂණ නොමැතිවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළි ගැනීමට හෝ නොහැකි විය. | නිවැරදි කිරීමට කටයුතු කරන බව . | අදාළ විගණන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ගොවිජන බැංකු 07ක රු.228,480,838ක් වටිනා ලෙජර් ගිණුම් 71ක් සඳහා උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | - එම - |

## 1.4 නීති,රීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත | | | |
| (i) | 22 වගන්තිය | කාරක සභා 15හිම කෘෂිකාර්මික ඉඩම්වලට වඩා සුදුසු බෝග හා සතුන් නිශ්චය කර වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | දෙපාර්තමේන්තු උපදෙස් අනුව ඉදිරි වසරේදී වැඩසටහන ක්‍රියාත්මක කරන බව . | පනත ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, එසේ නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ii) | 53(4) වගන්තිය | කාරක සභා 14ක ඉඩම් ලේඛන ප්‍රතිශෝධනය කර නොතිබුණි. | දෙපාර්තමේන්තු උපදෙස් අනුව ඉදිරියේදී ප්‍රතිශෝධන කටයුතු කරන බව . | - එම - |
| (ආ) | 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධිත) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 52 වගන්තිය | කාරක සභා 15 විසින්ම කෘෂිකාර්මික වැඩසටහනක් සහ සංවර්ධන සැලස්මක් පිළියෙල කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේදී අතපසුවී ඇතත් 2025 වර්ෂයට සකස් කර ඇති බව . | - එම - |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මු .රෙ.137 | කාරක සභා 03ක් විසින් අනුමැතියකින් තොරව වවුචර් 67 කින් රු. 3,892,858 ක් ගෙවීම් කර තිබුණි. | වවුචර් අනුමත කිරීමට කටයුතුකර ඇති බව . | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, අනුකූල නොවූ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ii) | මු.රෙ.225 | පනාවල කාරක සභාව විසින් බිල්පත් නොමැතිව රු.59,564 ක් ගෙවීම් කර තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව . | - එම - |
| (iii) | මු රෙ.257 | කාරක සභා 02ක රු.3,269,363 ක් වටිනා වවුචර් 66 ක් සහතික කිරීමකින් තොරව ගෙවා තිබුණි. | විගණනය හා එකඟ බවත් ඉදිරියේදි වැරදි සිදු නොවීමට කටයුතු කරන බව . | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවිජන බැංකු චක්‍රලේඛය | | | |
| (i) | 3.1 ඡේදය | කාරක සභා 02ක බල ප්‍රදේශය තුළ කෘෂි උපකරණ පදනම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ගොවි මහතුන් හඳුනාගෙන එම ව්‍යාපෘති දියත් කිරීමට ඔවුන්ව දිරිමත් කර කෘෂි උපකරණ ණය ලබාදීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කරන බව . | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, අනුකූල නොවූ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ii) | 3.8 ඡේදය | කාරක සභා 03ක කොටස් සහ කුඩා කණ්ඩායම් ගිණුම් විවෘත කරන ලද දිනම හා විවෘත කර දින 08 ත් 372 ත් අතර ණයකරුවන් 52 කුට රු.3,050,000 ක් වටිනා ව්‍යාපෘති ණය, නිකුත් කර තිබූ නමුත් ණය ගැණුම්කරුවන් ගිණුම් ආරම්භ කර තිබීම හා ගිණුම් ශේෂයක් පැවතීම ණය අයදුම්පත් නිර්දේශ කිරීම හා අනුමත කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි. | ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කරන බව. | - එම - |
| (iii) | 4.1 (V) වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළ ණය පාලන කමිටු සභාපතිගේ අනුමැතියකින් තොරව බැම්ණිවත්ත ගොවිජන සේවා කාරක සභාවේ රු.60,805,208 ක වවුචර් 252 කට ගෙවීම් කර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | - එම - |
| (ඉ) | 2023 අප්‍රේල් 24 දිනැති 07/12/07 චක්‍රලේඛය | කාරක සභා 06ක් විසින් ආපදා ණය ආවරණ ගිණුමේ රැස්වූ රු 5,305,795.ක් ස්ථාවර තැන්පතු ගිණුමක තැන්පත් කර නොතිබුණි. | ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කරන බව . | චක්‍රලේඛය ප්‍රකාරව මුදල් උපරිම ඵලදායී ලෙස කළමනාකරණය කළ යුතුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2024 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 15 හි එකතුව රු.14,610,477 ක අතිරික්තයක්ද, ගොවිජන බැංකු 14 ක එකතුව රු. 16,784,761 ක අතිරික්තයක්ද අඹේපුස්ස ගොවිජන බැංකුවෙහි රු.58,446 ඌණතාවයක්ද විය. 2023 වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 14 ක එකතුව රු. 12,671,292 ක අතිරික්තයක්ද, ගොවිජන බැංකු14 හි එකතුව රු. 27,412,849 ක අතිරික්තයක්ද විය.

#### 2.1.1 විශ්ලේෂණාත්මක සමාලෝචනය

(අ) සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා 15 ක අතිරික්තය පෙර වර්ෂයේ අතිරික්තය සමග සාපේක්ෂව කාරක සභා 07 ක රු.5,691,723 අතිරික්තයේ වර්ධනයක් සහ කාරක සභා 08 රු.4,747,835 ක අතිරික්තයේ පිරිහීමක් දක්නට ලැබුණි.

(ආ) ගොවිජන සේවා කාරක සභාවල මූලික කාර්යභාරයන් ලෙස පොහොර, කෘෂි රසායනික ද්‍රව්‍ය, බීජ හා පැළ, කෘෂි උපකරණ ඇතුළු කෘෂිකාර්මික භාණ්ඩ අලෙවි කිරීම වන අතර සමාලෝචිත වර්ෂයට අදාළව ගොවිජන සේවා කාරක සභා 15 හිම මුළු අලෙවියේ එකතුව රු. 53,215,521 ක් විය. මුළු දළ ලාභයේ එකතුව රු.8,131,170 ක් වූ හෙයින් ඒ අනුව එක් ගොවිජන සේවා කාරක සභාවක වාර්ෂික සාමාන්‍ය අලෙවි වටිනාකම රු.3,547,701 ක් වූ අතර, සාමාන්‍ය දළ ලාභය රු.542,078 ක් විය.

(ඇ) ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන වලට අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගොවිජනසේවා කාරක සභා 15 හි මූල්‍ය තත්ත්වය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | රු. | රු. |
|---|---|---|---|
| <u>මුළු වත්කම්</u> | | | |
| ජංගම වත්කම් | = | 93,272,254 | |
| ජංගම නොවන වත්කම් | = | 71,229,819 | 164,502,073 |
| | | -------------------- | |
| <u>මුළු වගකීම්</u> | | | |
| ජංගම බැරකම් | = | 67,708,927 | |
| දිගුකාලීන ණය වටිනාකම | = | 14,649,754 | 82,358,681 |
| | | ------------------ | ------------------ |
| සමුච්චිත අරමුදල් වටිනාකම (ශුද්ධ වත්කම්) | = | | 246,860,754 |
| | | | ========== |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මුදල් කළමනාකරණය

**(අ) අක්‍රීය බැංකු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | කාරක සභා 07 ක රු.198,226 ක ශේෂ සහිත ජංගම ගිණුම් 05 ක් සහ රු.22,073 ඉතිරි කිරීම් ගිණුම් 03ක් අක්‍රියව පැවතුණි. | අවශ්‍ය නැති ගිණුම් වසා දැමීමටත් අනෙක් ගිණුම් සක්‍රියව පවත්වාගෙන යාමටත් කටයුතු කරන බව . | බැංකු ගිණුම් සක්‍රීයව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ii) | කමිටු ජංගම ගිණුම් 10 ක 2024 වර්ෂයේ මාසිකව රු.20,350 - රු.3,992,476 ත් අතර සහ කමිටු ඉතිරි කිරීම් ගිණුම් 02 ක රු.445,963 ත් 10,418,127 ත් අතර මුදලක් සහ ගොවිජන බැංකු ඉතිරි කිරිමේ සහ ජංගම ගිණුම් 02 ක 2024 වර්ෂයේ මාසිකව රු.965,468 ත් රු.3,301,321 ත් අතර මුදලක් රඳවාගෙන තිබෙන අතර එය ඵලදායී ආයෝජනයක යොදවා නොතිබුණි. | ඵලදායී ආයෝජනයක යෙදවීමට කටයුතු කරන බව . | විධිමත් අනුමැතිය මත වැඩිපුර මුදල් සඵලදායි ආයෝජනයක යෙදවිය යුතු වීම. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාරක සභා 03 ක ලියාපදිංචි කළ සිතමු කාන්තා ගොවි සංවිධාන 299 කින් ගොවි සංවිධාන 162 ක් අක්‍රීයව පැවතුණි. | දෙපාර්තමේන්තු උපදෙස් ලබාගෙන දුර්වල සමිති ඇවර කිරීමටත් කාන්තා සමිති සක්‍රීය කිරීමේ වැඩසටහනක් ආරම්භ කර කෘ.ප.නි.ස වරුන්ට ඉලක්ක ලබාදී ප්‍රගතිය ඇගයීම සිදුකරන බව . | ලියාපදිංචි ගොවි සංවිධාන හා අනෙකුත් සමිති සක්‍රියව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මධ්‍යස්ථාන 15හි පිහිටි අක්කර 13 රූඩ් 03 පර්චස් 33.21 ක් වූ ඉඩම් වල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කරමින් පවතින බව දන්වා ඇත. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි සියළු මධ්‍යස්ථාන ඉඩම් පවරා ගත යුතුය. |
| (ආ) | 2024/2025 මහ කන්නයට අදාළ කාල සීමාව 2025 මාර්තු මසින් අවසන් වුවත්, කාරක සභා 07ක මුළු ගොවීන් 9,389 කට අදාළ රු. 48,713,633 ක සහනාධාර මුදලකින් 2025 පෙබරවාරි 15 දිනට රු.11,411,874 ක් ගෙවා නොතිබූ බැවින් ගොවීන්ට අවශ්‍ය සහනාධාර මුදල් කන්නයට අදාළ කාල සීමාවේදී ලබාදී නොතිබුණි. | පොහොර සහනාධාර මුදල් ගොවීන් වෙත බැර කිරීම, තොරතුරු කළමනාකරණ ඒකකයෙන් සහ දිස්ත්‍රික් කාර්යාල මඟින් සිදුවන බව . | සහනාධාර පොහොර මුදල් කන්නයට අදාළව ලබාදිය යුතු අතර, එසේ කටයුතු නොකළ පාර්ශව වෙත පියවර ගත යුතුය. |
| (ඇ) | ගොවි ආරවුල් සඳහා විසඳුම් ලබාදීම මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයක් වන නමුත් පසුගිය වර්ෂවලට අදාළව | දිස්ත්‍රික් කාර්යාලය වෙත යොමුකල පැමිණිලි සඳහා පරීක්ෂණ සිදු වෙමින් | ගොවි ආරවුල් සඳහා කාලීනව විසඳුම් ලබා දීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මධ්‍යස්ථාන 05 ක් වෙත ලැබුණු ගොවි පැමිණිලි 715 කින් පැමිණිලි 562 ක් සඳහා විසඳුම් ලබාදී තිබූ අතර පැමිණිලි 153 ක් සඳහා විසඳුම් ලබාදී නොතිබුණි. | පවතින බව. | |
| (ඈ) | කාරක සභා 10ක ගොවිජන බල ප්‍රදේශයේ මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය කැබිලි 45,694 ක් වන අතර, මෙම කැබලි සියල්ලම Geogovia පද්ධතිය භාවිතා කර මැණුම් සිදුකර අවසන් කර ඇතත්, ඩිජිටල් කුඹුරු ඉඩම් නාම ලේඛනයට ඉඩම් කැබලි 13,020 ක් ඇතුළත් කර නොතිබුණි. | අලුතින් ඉදිරිපත් කරන ලද කුඹුර ඉඩම් නාමලේඛනයේ අයදුම්පත් විදිමත් පරිදි භාර දීමට කටයුතු කල පසු සිතියම් ගත කිරීම සම්පූර්ණ කරන බව . | ගොවිජන සේවා බල ප්‍රදේශවල සියළු කුඹුරු ඉඩම් සිතියම්ගත කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඉ) | ගොවිජන සේවා මධ්‍යස්ථාන 13 ට අදාළ බල ප්‍රදේශවල වී වගාව සඳහා යෙදවිය හැකි පුරන් කුඹුරු ප්‍රමාණය (A වර්ගය) අක්කර 1062.64 ක් වන අතර, වෙනත් වගාවන් සඳහා යෙදවිය හැකි(B වර්ගය) ප්‍රමාණය අක්කර 756.83 ක් සහ C භාණ්ඩයට අයත් පුරන් කුඹුරු ප්‍රමාණය අක්කර 637.84 ලෙස සමාලෝචිත වර්ෂය අවසාන වනවිට හඳුනාගෙන තිබූ නමුත් පුරන් කුඹුරු අස්වැද්දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කුඹුර ඉඩම් සොයා බලා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගත් බව හා ඒ ඒ ප්‍රදේශවල පවතින ප්‍රායෝගික ගැටළු මත කුඹුරු පුරන් වී ඇති බව . | පුරන්ව පවතින සියලු කෘෂිකාර්මික ඉඩම් වගා කරවීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 07ක විකුණා මුදල් ගෙවීමේ පදනම මත කෘ.ප.නි.ස නිලධාරීන් වෙත ලබා දෙන භාණ්ඩවලට අදාළව සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,537,541 ක් ලැබිය යුතුව පැවතුණි. | එම නිලධාරීන්ව සති රැස්වීමේදී හා ලිපි මඟින් දැනුවත් කර ඇත. ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව . | විකුණා මුදල් ගෙවීමේ පදනම මත ලබාදෙන භාණ්ඩ සඳහා අදාළ කාලය තුළදී මුදල් අයකරගත යුතු අතර, එසේ නොගෙවන නිලධාරීන්ට පියවර ගත යුතුය. |
| (ආ) | යුධ හමුදාව විසින් 1992 වර්ෂයේදී රැගෙන ගිය පිරිවැය රු.978,173 වූ ට්‍රැක්ටර්යක් හා ටේලරයක් ආපසු ලබා ගැනීමට යටියන්තොට ගොවිජන සේවා කාරක සභාව මේ දක්වාම කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව තොරතුරක් සොයා ගත නොහැකි නිසා ගිණුම්වලින් ඉවත් කිරීමට නොහැකි වී ඇති බව . | අදාළ වත්කම් ආපසු ලබා ගැනීමට පියවර ගත යුතුවීම. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල ,පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අරණායක ගොවිජන සේවා කාරක සභාවෙහි 2021 වර්ෂයේ රු.130,000 කට මිල දී ගත් කොළ කැබලි කිරීමේ යන්ත්‍රය කාබනික පොහොර නිෂ්පාදනය නොකිරීම මත භාවිතයට ගෙන නොතිබූ අතර හත්ගම්පල පොහොර ගබඩාව හා නාරංගම්මන අලෙවිසැලද නිෂ්ක්‍රීයව පැවතුණි. | කාබනික පොහොර වැඩසටහන් ක්‍රියාත්මක නොවීම හා ඒ පිළිබඳ ගොවීන්ගේ උනන්දුව අඩුවීම කැබලිකිරීමේ යන්ත්‍රය භාවිතාවීම අවම වීමට හේතු වී ඇති බව . | වත්කම් පූර්ණ උපයෝජනය කිරීමට වැඩපිළිවෙලක් යෙදිය යුතුය. |
| (ආ) | කාරක සභා 02ක 2014 වර්ෂයේ මිලදී ගෙන තිබූ ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනාගැනීමේ යන්ත්‍රය නිෂ්කාර්යව පැවතුණි. | මෙතෙක් එම යන්ත්‍රය භාවිතා නොකළ අතර,ඉදිරියේදී භාවිතයට කටයුතු කරන බව . | - එම - |
| (ඇ) | කාරක සභා 10ක 2024 වර්ෂයේ නොවැම්බර් මස රු.1,261,300 කට මිලදීගෙන තිබූ pass book printer යන්ත්‍ර භාවිතයට අවශ්‍ය පාස්පොත් ගොවිජන බැංකුව වෙත ලැබී නොතිබීම හා බැංකු මෘදුකාංග පද්ධතිය ස්ථාපිත නොකිරීම හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි. | මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කළ පසු මෙම යන්ත්‍රය භාවිතයට ගන්නා බව . | හැකි ඉක්මනින් මෙම යන්ත්‍ර භාවිතයට ගැනීමේ වැඩපිළිවෙලක් යෙදිය යුතුය. |

## 3.6 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක සභා 07ක සමාලෝචිත වර්ෂය තුළදී අත්‍යවශ්‍යයෙන්ම ප්‍රතිසංස්කරණය කළ යුතු සුළු වාරිමාර්ග 381 ක් ඇතුළත් ප්‍රමුඛතා ලේඛනයක් ඉදිරිපත් කර තිබුණද, ඉන් 336 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | ප්‍රමුඛතවාය අනුව වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් වූ ප්‍රතිසංස්කරණයන් පමණක් සිදු කර ඇති බව. . | ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රියාත්මක කර පුරන් කුඹුරු වගා කිරීමට ගොවීන් යොමු කිරීමට වැඩපිළිවෙලක් යෙදිය යුතුය. |
| (ආ) | ගොවිජන සේවා 13 කට අදාළ බල ප්‍රදේශ තුළ වැව් 25 ක් , අමුණු 1,275 ක් කෘෂි මාර්ග 557 සහ කෘෂි ඇල මාර්ග 521 කින් සමන්විත වුවද, ඉන් අමුණු 312ක්, කෘෂි මාර්ග 17 ක් සහ ඇල මාර්ග 08 ක් අක්‍රිය මට්ටමේ පැවතුණි. | වාර්ෂිකව ගොවි සංවිධාන මඟින් ප්‍රමුඛතා ලේඛන කැඳවා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව . | අක්‍රිය වැව්, අමුණු, කෘෂි ඇළ සහ කෘෂි මාර්ග සියල්ල ක්‍රියාකාරී තත්ත්වයට පත් කිරීමට වැඩපිළිවෙලක් යෙදිය යුතුය. |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 දෙසැම්බර් 31 දිනට කාරක සභා බල ප්‍රදේශ 15 හි ප්‍රාදේශීය නිලධාරි තනතුරු 05 ක් හා කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුරු වසම් 175 ක් පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු කාරක සභා සහ වසම් සඳහා වැඩ බැලීම සඳහා නිලධාරීන් පත්කර ඇති අතර, රජය මඟින් මෙතෙක් පත්වීම් ලබාදී නොමැති බව . | කාර්ය මණ්ඩල සමාලෝචනයක් සිදු කර අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කිරීමට වැඩපිළිවෙලක් යෙදිය යුතුය. |

## 04 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළව ගොවිජන සේවා කාරක සභා 15 හිම ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණද, වර්ෂය අවසානයේ එහි ප්‍රගතිය සකස් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 අයවැය ඇස්තමේන්තු හා සත්‍ය ආදායම් හා වියදම් සැසඳීමේදී අදායම් සහ වියදම් ශීර්ෂ 420 ක සියයට 10 සිට සියයට 3369 ත් අතර විචලන පරාසයක් පැවතීම හේතුවෙන් පාලන ක්‍රමවේදයක් ලෙස යොදා ගනු ලබන අයවැය ලේඛනය කාරක සභාව විසින් ඵලදායී පාලන උපක්‍රමයක් ලෙස යොදාගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස යොදා ගත යුතුය. |

### 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගෙවතු වගා වැඩසටහන යටතේ ගොවිජන සේවා කාරක සභා 11 ක ගොවීන් වෙත ලබාදුන් රු.4,305,,512 ක මිරිස් පැළ 809,752 කින් රු. 2,806,987 ක පැළ 472,753 ක් විනාශ වී තිබු අතර | දැඩි අයහපත් කාලගුණික තත්ත්වය මෙයට හේතු වූ බව. | සැළසුම් සකස් කිරීමේදී කාලගුණික, දේශගුණික තත්ත්වයද සැලකිල්ලට ගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | බැම්ණිවත්ත කාරක සභාවෙහි ගොවීන් 385 ක් වෙත බෙදා දී තිබූ රු.1,262,800 ක් වටිනා මැකරල් බීජ පැකට් 1540 කින් මෙට්‍රික් ටොන් 50 ක අස්වැන්නක් අපේක්ෂිතව තිබුණද, මෙට්‍රික් ටොන් 24 ක අස්වැන්නක් පමණක් ලැබී තිබීමෙන් මෙම වැඩසටහන අසාර්ථක ව්‍යාපෘතියක් වී තිබුණි. | | යුතුය. |
| (ආ) | පරගම්මන කාරක සභාවේ ආරක්ෂිත ගෘහ ඉදිකිරීම සඳහා එක් ගෘහයක් සඳහා රජයේ දායකත්වය ලෙස රු.500,000 බැගින් පරගම්මන ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ප්‍රතිලාභීන් 22 ක් තෝරාගෙන රු.21,890,000 ක් ගෙවා තිබුණද, ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2023 ඔක්තෝබර් 06 දිනැති 7/3/19/S.A.V/2023 මාර්ගෝපදේශයේ ඇමුණුම 01 යටතේ වූ අවබෝධතා ගිවිසුමේ 06 (1) ඡේදය ප්‍රකාරව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ඉඩමේ නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීමට පිළිගත හැකි ලේඛනයන් විගණනයට නිරීක්ෂණය නොවුණි. | වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වන මාර්ගෝපදේශය පරිදි ප්‍රතිලාභීන් තෝරාගෙන ඇති බව. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික නිර්ණායකයක් වූ ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පිළිගත හැකි නීත්‍යානුකූල ලේඛන මඟින් තහවුරු කළ යුතු වීම. |
| (ඇ) | පරගම්මන කාරක සභාවේ ඇකිරියගල කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර වසමේ ඉදිකර තිබූ හරිතාගාරයෙහි ඉදිකිරීම් අවසන් කර රු.995,000 ගෙවා ඇතත්, වගාවන් ආරම්භ කර නොතිබුණු බැවින් , වියදමෙහි කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ශූන්‍ය මට්ටමේ පැවති අතර, 2023 ඔක්තෝබර් 31 දිනැති අවබෝධතා ගිවිසුම අනුව මෙම හරිතාගාරය කෑගල්ල දිස්ත්‍රික් ගොවිජන සංවර්ධන බල ප්‍රදේශයට අයත් නොවන මහනුවර, අස්ගිරිය ප්‍රදේශයේ පදිංචි අයෙකුට ලබාදී තිබීම හා ගිවිසුම්ගත වීමට හේතු විගණනයට පැහැදිලි නොවුණි. | හදිසි විදේශගතවීම හේතුවෙන් ඔහුගේ පියාට වගා කටයුතු භාරදී ඇත. | අවබෝධතා ගිවිසුම අනුව කටයුතු කළ යුතු අතර, දිස්ත්‍රික්කයෙන් බැහැර පුද්ගලයෙකු හට ලබා දීමට අදාළ විධිමත් පරීක්ෂණයක් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | පරගම්මන කාරක සභාවේ ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනයෙහි පුද්ගලයන් 04 දෙනෙකුගේ නම් සඳහන් කරමින් පුද්ගලයන් දෙදෙනෙකුට රු 1,990,000ක් වටිනා හරිතාගාර 2 බැගින් ලබා දී තිබූ නිසා සාම්ප්‍රදායික වගාකරුවන් කෘෂි ව්‍යවසායකයින් බවට පත් කිරීමේ අරමුණු විහිදී ගොස් තිබුණි. | අපේක්ෂා කළ ගොවීන් සංඛ්‍යාවක් කැමැත්ත ප්‍රකාශ නොකිරීම හේතුවෙන් ඉල්ලුම් කරන ගොවීන් වෙත ලබා දී ඇති බව. | විධිමත් පරීක්ෂාවක් සිදු කර අදාළ පියවර ගත යුතුය. |
| (ඉ) | නවීන තාක්ෂණ ක්‍රමවේදය අනුව ස්වයංක්‍රීය ජල විහිදුම් පද්ධතියක් මඟින් ජලය යෙදීමට පරගම්මන කාරක සභාව විසින් ගොවීන් 22 ක් වෙත පහසුකම් සලසා තිබුණද, ප්‍රතිලාභීන් 22 අතුරින් තිදෙනෙකු පමණක් උක්ත ක්‍රමය මඟින් ජලය යෙදීම සිදුකර තිබුණු බැවින් ව්‍යාපෘතියේ අරමුණක් වූ නවීන තාක්ෂණය යොදා ගැනීම සියළුම ප්‍රතිලාභීන් විසින් ඉටු කර නොතිබුණි. | බොහෝ ගොවීන් නිවස ආසන්නයේ පදිංචි බැවින් මෙම උපකරණ භාවිතා නොකරන ලද බව . | නවීන තාක්ෂණයෙන් යුතු ජල විහිදුන් පද්ධති භාවිතා කිරීම සඳහා ව්‍යවසායකයින් යොමු කිරීමට අදාළ නිලධාරීන් කටයුතු කළ යුතුය. |

**5. ගොවි බැංකු**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ගොවි බැංකු 11ක ඉතුරුම් ගිණුම්වල රු.31,697,175ත් රු.79,366,712ත් අතර ශේෂයන් හා ජංගම ගිණුම් වල රු2,037,925ත් රු.21,533,667ත් අතර ශේෂයන් පැවති නමුත් අතිරික්ත මුදල් ඵලදායී ආයෝජනයක යෙදවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | විධිමත් අනුමැතිය යටතේ ඵලදායී ආයෝජනයක යෙදවීමට කටයුතු කළ යුතුවීම. |
| (ආ) | අරණායක ගොවිජන බැංකුවේ කමිටු තීරණයක් මත කොන්ත්‍රාත්වලින් සියයට 1 ක් ගොවිජන සංවිධාන සුභ සාධක කටයුතු වෙනුවෙන් සංවර්ධන අරමුදල නමින් ගිණුමකට බැර කර එම මුදලින් 2024 වර්ෂය තුල රු. රු.493,987 ක් වැය කර ඇතත්, වවුචර්වල උපයෝගී ලේඛන අමුණා නොතිබුණු අතර, එම ගිණුමේ රු.958,333 ක වර්ෂාවසාන ශේෂය ගිණුම්වල හෙලිදරව් නොකර ජ'නල් සටහනක් මඟින් කොටස් තැන්පත් පාලන ගිණුමට මාරු කර තිබුණි. | ගොවි සංවිධාන නියෝජිතයන් විසින් මෙම ගිණුමේ ගණුදෙනු කරන බවත් 1%ක මුදල අතපසුවීමකින් බැරවී ඇති බවත් එය ජ'නල් සටහනක් මඟින් නිවැරදි කර ඇති බව. | වර්ෂාවසාන ශේෂය නිවැරදිව ගිණුම්වල හෙලිදරව් කළ යුතු අතර, අදාළ නිවැරදි කිරීම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ගොවිජන බැංකු 11ක ණය කලට වේලාවට අයකර ගැනීම ණය අයකර ගැනීම් ක්‍රියාවලියට සහාය දැක්වීම කාලීනව හිඟණය අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම හා කාර්ය මණ්ඩල මෙහෙයවීම සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම යන කරුණු පිළිබඳ අදාළ නිලධාරීන්ගේ වගකීම නිසි පරිදි ඉටු නොකිරීම හේතුවෙන් කල් පසු වූ හිඟ ණය රු 127,575,674.ක් හා කල් පසු නොවූ හිඟ ණය රු 32,374,002ක් පැවතුණි. | ඉදිරියේදී අයකරන බවට කටයුතු කරන බව . | බැංකු ණය කාලීනව අයකර ගත යුතු අතර, කාලීනව අය කිරීමට පියවර නොගත් නිලධාරීන්ට පියවර ගත යුතුය. |